**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**-------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව්කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

සභාව විසින් ඉදිකර සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන්කර තිබූ ළමා උද්‍යානයේ පිරිවැය රු. 4,504,116 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 6,245,000 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම නොවන වත්කම් වල අගය රු. 1,740,884 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.3 ගෙවියයුතු ගිණුම්
**-------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂයේ ලබාගත් රු. 7,591 ක අත්තිකාරම් මුදල ගෙවා නිමකිරීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වමින් තිබුණි.

(ආ) 1996 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයේ සභාවේ සේවය කළ සේවකයින් 08 දෙනෙකුට ගෙවිය යුතු වැටුප් රු. 457,193 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ගෙවීමට කටයුතු නොකර දිගටම ගිණුම් ප්‍රකාශනවල දක්වමින් තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණන සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| නොගෙවූ වැටුප් හා වේතන | 299,018 | විස්තරාත්මක උපලේඛන |
| ආදායම් වෙනුවෙන් තැන්පත් | 156,649 | තැන්පත් ලේඛන |

### 1.3.5 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති පරිච්ඡේදය I රීති 5(12) | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් කිරීම් නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුණද, ඒ අයගෙන් ආරක්ෂක ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) පළාත් මූල්‍ය රීති අංක 237 | මස හයකට පෙර නිකුත්කර තිබූ, බැංකුවට ඉදිරිපත්කර නොතිබූ රු. 1,033,492 ක් වටිනා චෙක්පත් 48 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) මෝටර් රථ ප්‍රවාහන නීතියේ 203 වගන්තිය | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන 05 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම්වලින් රු. 34,820,840 ක් පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායමක් ලබා තිබූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් රු. 16,197,286 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 ආදායම් රුස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විස්තර | ඇස්තමේන්තුගත ආදායම් | තත්‍ය ආදායම් | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් බදු | 22,000 | 2,686 | 19,315 |
| කඩකුලී | 6,720 | 3,195 | 3,525 |
| සේවා ගාස්තු | 223 | 127 | 96 |
| බලපත්‍ර ගාස්තු | 1,875 | 1,302 | 573 |

### 2.2.2 ආදායම් පරිපාලනය

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අයත් හිඟ මස්කඩ කුලී රු. 2,966,529 ක මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාව කටයුතුකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂය සිට හිඟව තිබූ එකතුව රු. 1,042,614 ක්වූ වාහන කුලී ආදායම්, බැංකු පොලී සහ ප්‍රාග්ධන පොලී අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන සංචාරක හෝටල් 09 ක වාර්ෂික ආදායමෙන් සියයට 01 බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සංචාරක හෝටල්වල 2012, 2013 වර්ෂ වලට අදාලව වාර්ෂික ආදායම් වෙනුවට ශුද්ධ ලාභය මත බදු අයකර ගැනීමෙන් රු. 65,429 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ii) සංචාරක හොටල් හතරකින් වර්ෂ හතරක සහ තවත් සංචාරක හෝටල් දෙකකින් වර්ෂ දෙකක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**2.2.3 වරිපනම් බදු සහ බදු**

-----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නිලාවෙලි සහ කුච්චවෙලි යන ප්‍රදේශවල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ලවා වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිත්‍යාග වශයෙන් වෙනත් ආයතනවලින් ලැබී තිබූ වාහන 05 ක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක් සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද ඒවා සභාවේ නමට මාරු කිරීම් සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය අනුව සේවකයන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍ර සවිකර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී පුල්මෝට්ටේ අනාථ කඳවුරුවල රැඳී සිටි අය සඳහා සභාව විසින් නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය වෙනුවෙන් කරන ලද සුභ සාධන සේවාවන් සඳහා වැය කරන ලද රු. 2,354,448 ක මුදල අදාල අමාත්‍යාංශයෙන් මෙතෙක් ලබා ගෙන නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කර උපචිය නොවූ චෙක්පත් 06 ක වටිනාකම වන රු. 16,690 ක මුදල අදාල පුද්ගලයන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ 02 සිට වර්ෂ 27 ක් දක්වා සභාවේ තැන්පත්තර තිබූ විවිධ තැන්පත් රු. 12,423,015 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) වර්ෂ 32 කට පෙර සේවය හැර ගිය සේවකයන් 05 දෙනෙකුගෙන් ලබාගෙන තිබූ එකතුව රු. 8,500 ක්වූ ඇප තැන්පත් මුදල ආපසු ගෙවීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(උ) සභා සේවකයින් 10 දෙනෙකුගේ රු. 273,545 ක හිඟ සේවක ණය ඒ අයගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සභාවේ හිටපු ලේකම්වරයා 2015 වර්ෂයේදී ලබාගෙන තිබූ අත්තිකාරම් මුදල වන රු. 1,493,294 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි.

(එ) සභාව විසින් ධාවනයේ යොදවා තිබූ පික්කප් වාහනය 2015 වර්ෂයේදී අනතුරට ලක්වී සම්පූර්ණයෙන් හානිවී තිබුණද, අදාල රක්ෂණ සමාගමෙන් වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ජලය බෙදාහැරීමේ වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රජා මධ්‍යස්ථාන 08 ක් සඳහා 2013 වර්ෂයේ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ රු. 1,000,000 ක මුදල නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2002 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයේ සභා සේවකයින්ට හා වෙනත් ආයතනවලට ලබා දෙන ලද එකතුව රු. 3,744,138 ක අත්තිකාරම් මුදල නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) 2015 වර්ෂයේ තොග සමීක්ෂණයේදී සභාවේ පුස්තකාල 8 කට අදාලව පොත් 599 ක් අඩුවෙන් ඉදිරිපත්කර තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ක) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක EST – 8/UNIFO/06/0302/6 දරන 2013 අප්‍රේල් 22 දිනැති චක්‍රලේඛය අනුව සේවකයින්ගේ නිල ඇඳුම් වෙනුවට 2013 ජනවාරි 01 දින සිට වාර්ෂිකව රු. 4,000 ක් බැගින් මුදලින් ගෙවිය යුතුය. කෙසේ වුවද, මෙයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 150,150 ක් වටිනා නිල ඇඳුම් බෙදාහැර තිබුණි.

මෙසේ ලබාදෙන ලද නිල ඇඳුම් හොඳ තත්ත්වයක නොතිබුණු බැවින් එය ප්‍රයෝජනයට ගත නොහැකිව තිබෙන බව සේවකයින් ලිඛිතව විගණනයට වාර්තා කළ බැවින් නිල ඇඳුම් සඳහා වැය කළ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

---------------------------------

2015 පෙබරවාරි 05, මාර්තු 23,24 සහ 25 යන දින වල සභාවේ සභාපති, රාජකාරි සඳහා සභාවේ උපකාර්යාලවලට සහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට ගියබව රාජකාරී වාහනයේ ධාවන සටහන් අනුව සනාථ වුවද, එම දිනවල කොළඹ රාජකාරි සඳහා ගිය බව සඳහන් කර සංයුක්ත දීමනා සහ ගමන් වියදම් වශයෙන් රු. 43,100 ලබාගෙන තිබුණි.

**4 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනටවූ අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | - | - |
| සහායක | 27 | 19 | 08 | - |
| සුළු සේවකයින් | 44 | 72 | - | 28 |
| එකතුව | 72 | 92 | 08 | 28 |

කළමනාකරණ සහායක තනතුරු 08 ක්, වසර 05 ක කාලයක සිට පුරප්පාඩුවී තිබුණද එය පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ලෙජර යාවත්කාලිනව පවත්වා නොතිබුණි. |
| | | (ii) | වත්කම් වියදම් වල ස්වභාවය අනුව වර්ගීකරණය කර නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| | | (ii) | ගබඩා ලෙජරය නිසි ලෙස පවත්වා නොතිබුණි. |
| (ඇ) | ආදායම් අයකිරීමේ පරිපාලනය | | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |